## <u>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය</u>

## මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා කාර්යය මණ්ඩලය බඳවා ගැනීම.

**01.** **මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ව්‍යාපෘතිය**

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 3 වන කොටස යුරෝපීය ආයෝජන බැංකු (EIB) අරමුදල් මඟින් මූල්‍යනය කර ඇත. මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ වඩා හොඳ අපජල කළමනාකරණ සේවා සැපයීම මඟින් මහ කොළඹ පදිංචිකරුවන්ගේ නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍යය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැය ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 53කි. ව්‍යාපෘතියේ කාලසීමාව මාස 30කි. 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) පහත සඳහන් පුරප්පාඩුව සඳහා **කොළඹ මහ නගර සභාවේ** සුදුසුකම් සපුරන හා යෝග්‍ය නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් මට්ටම |
|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | PS 1 |

**සාමාන්‍ය කොන්දේසි**

- ශ්‍රී ලාංකික පුරවැසියන් පමණක් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.
- විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතිවල පළපුරුද්ද සහිත අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාව හිමිවේ.
- **තෝරාගැනීමේ ක්‍රමය** - සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කළ අයදුම්පත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.
- **වයස** - අයදුම්පත් බාර ගන්නා අවසාන වන දිනට වයස අවු. 60ට අඩු විය යුතුය.
- **රැකියා කොන්දේසි** - මෙම පත්වීම පූර්ණකාලීන පදනමෙන් වන අතර කොන්ත්‍රාත් සේවා කාලය බඳවා ගැනීමේ දින සිට 2024.12.31 දින දක්වා වන අතර කාර්යසාධන මට්ටම අනුව ව්‍යාපෘතියේ ඉතිරි කාලය සඳහා දීර්ඝ කිරීම සලකා බැලේ.
- අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ අංශයේ ප්‍රධානියා සහ නාගරික කොමසාරිස්ගේ නිර්දේශ සමඟ යොමු කළ යුතු වේ.
- මේ සම්බන්ධයෙන් කැමැත්තක් දක්වන අයදුම්කරුවන් තම ජීව දත්ත පත්‍රිකාව (CV) අදාල අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද සහතික කරන ලිපිලේඛනවල සහතික කළ පිටපත් සමඟ **<u>ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02</u>** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් **2024 අප්‍රේල් 24** වන දින පස්වරු **3.00**ට පෙර එවිය යුතු වන අතර එහි මෘදු

පිටපත් admin.div@pclg.gov.lk යන විද්‍යුත් ලිපිනයට ඉහත දිනයේදී අදාළ වේලාවට පෙර යොමු කළ යුතුය.

- තනතුරු නාමය සහ ව්‍යාපෘතියේ නම ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ සඳහන් කළ යුතු වේ.
- අසම්පූර්ණ අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහතිකලත්වල තොරතුරු හා නොගැලපෙන අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු.: තනතුරට අදාල සුදුසුකම්, පළපුරුද්ද හා වැටුප් සම්බන්ධ තොරතුරු සහ වෙනත් අමතර තොරතුරු සඳහා කරුණාකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019.03.05 දිනැති චක්‍රලේඛය පරිශීලනය කළ යුතුවේ.**

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

2024.04.09